# 1වන කොටස

# ලංසුකරුවන් සඳහා උපදෙස් (අයි.ටී.වී)

## අ: පොදු කරුණු

| | | | |
|---|---|---|---|
| 1 | මිල යෝජනාවේ විෂය පථය | 1.1 | මෙහි තුන්වන කොටසේ පෙන්වාදී ඇති භාණ්ඩ ලැයිස්තුවේ දැක්වෙන භාණ්ඩ සැපයීම සඳහා දත්ත පත්‍රිකාවේ නම් කර ඇති ගැණුම්කරු වෙතින් මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මෙකී කැඳවීම ලැබීමෙන් පසු පසු එය ලද බවත්, මිල යෝජනා ඉදිරිපත් කිරීමට කැමැත්ත දක්වන බවත් දන්වා සිටිය යුතුවේ. මිළ යෝජනා කැඳවීම ලද බව දැන්වීමවට හෝ ඉහත පෙන්වා දුන් පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීමට හෝ අපොහොසත් වීම හේතුවෙන් අනාගතයේදී ඔබගේ මිල ගණන් ඉදිරිපත් කිරීමට ඇති අවස්ථා නොසලකා හැරීමට ගැණුම්කරු ක්‍රියා කරනවා ඇත. |
| 2.1 (ආ) අන්තර්ගත ලේඛණ | | | |
| 2. | | 2.1 | පහත දැක්වෙන දෑ ලේඛණවලට අයත් වේ. |
| | අන්තර්ගත ලේඛන | | I  වන කොටස ලංසුකරුවන්ට උපදෙස්.<br>ii. වන කොටස : දත්ත පත්‍රිකාව<br>iii. වන කොටස : අවශ්‍යතා උපලේඛනය.<br>iv. වන කොටස :තාක්ෂණික පිරිවිතර හා පරිවිතරවල අනුකූලතාවය.<br>v. වන කොටස: මිළ යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘතිපත්‍රය. |
| (ඇ). මිල යෝජනා සැකසීම. | | | |
| 3. | මිළ යෝජනාවලට ඇතුළත්වන ලේඛණ | 3.1 | මිල යෝජනා වලට පහත දැක්වෙන ලේඛන ඇතුලත්විය යුතු වේ.<br>(අ). මිළ ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘති පත්‍රය හා මිල යෝජනා.<br>(ආ). තාක්ෂණික පරිවිතර හා ඒවාට අනුගතවන විස්තර දැක්වීම. |
| 4. | මිල යෝජනා ඉදිරිපත් කිරීමේ ආකෘතිය හා මිල යෝජනා ලේඛණය. | 4.1 | ඉහත v වන කොටසේ දැක්වෙන ආකෘති පත්‍රය යොදා ගෙන ලංසු කරුවන් විසින් මිල යෝජනා ඉදිරිපත් කළ යුතුවේ. ආකෘති පත්‍රයේ ස්වරූපය විකෘති වන ආකාරයේ වෙනස් කම් නොකළ යුතුවේ. විකල්ප ආකෘති පිළිගනු නොලැබේ. ආකෘති පත්‍රයේ හිස්තැන් නොතිබෙන සේ ඉල්ලා ඇති විස්තරවලින් හිඩැස් පරිවිය යුතුවේ. |
| | | 4.2 | විකල්ප මිලයෝජනා සලකා නොබැලේ. එකම අයිතමයක් සඳහා විකල්ප මිල යෝජනා ඉදිරිපත් නොකරන ලෙස සැපයුම් කරුවන්ට උපදෙස් දෙන අතර, ඔවුන් සතු ඉහලම තරගකාරී මිල ගණන් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිනු ලැබේ. |
| 5. | මිල ගණන් හා වට්ටම්. | 5.1 | දත්ත පත්‍රිකාවේ විශේෂ කොට දක්වා නැති අවස්ථාවල හැරෙන්නට අනික් සියළුම මිළ යෝජනා ලංසු ලේඛණවල ඒ ඒ අයිතමයට වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුවේ. |
| | | 5.2 | මිල යෝජනා වලින් ඉදිරිපත් කරන ගණන් සඳහා වට්ටම් ලබාදෙන්නේ නම් ඒවාත් ඇතුලත්ව මුළු ගනණක් වශයෙන් මිල යෝජනා ඉදිරිපත් කරන ආකෘතියේ දැක්විය යුතුය. |
| | | 5.3 | අදාළවන වැට් බදු මුදල වෙනම දැක්විය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | 5.4 | ලංසුකරුවන් විසින් ඉදිරිපත්කර ඇති මිළ ගණන් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මකවන අතර වාරයේ ස්ථිර කර ගන්නවා හැරෙන්නට වෙනත් කවර හේතුවක් නිසා හෝ වෙනස් නොකළ යුතුය. ගැළපුම් කර ගැනීමේ අදහසින් ඉදිරිපත් කර ඇති මිළ යෝජනා ප්‍රතිචාර නොදැක් වූ ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 6 | මුදල් වර්ගය | 6.1 | ලංසුකරුවන් විසින් තම මිල යෝජනා ඉදිරිපත්කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල්වලින් පමණි. |
| 7. | භාණ්ඩවල යෝග්‍යතා තහවරු කරන ලේඛණ සාක්ෂි. | 7.1 | ලංසුකරුවන් විසින් තම මිල යෝජනාවේ කොටසක් ලෙස iv කොටසේ නිශ්චිතව දක්වා ඇති අදාල භාණ්ඩ තාක්ෂණික පිරිවිතරවලට හා ප්‍රමිතීන්වලට අනුකූල වන බවට වන ලේඛන ගත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |
| | | 7.2 | ලේඛනගත සාක්ෂි, ලේඛණ ආකාරයෙන්, ඇඳීම් මාර්ගයෙන් හෝ සාහිත්‍යමය ආකාරයෙන් විය හැකිය. ඒවායේ භාණ්ඩවල අත්‍යාවශ්‍ය තාක්ෂණ හා ක්‍රියාකාරීත්ව විශේෂ ලක්ෂණ ඇතුළත් වන පරිදි අයිතමයෙන් අයිතමයට පුළුල් පැහැදිළි කිරීම් ඊට ඇතුළත් විය යුතු වේ. එමෙන්ම අදාළ වේ නම් සපයා ඇති තාක්ෂණ පිරිවිතර වලින් බැහැරවීම පිළිබඳව ප්‍රකාශයක් ඇතුළත් කළ හැකිය. |
| | | 7.3 | දත්ත පත්‍රිකාවේ දක්වා ඇත්නම්, මෙම භාණ්ඩ ශ්‍රී ලංකාවේ අළෙවි කිරීමට නියෝජිතයකු ලෙස විධිමත් පරිදි පත් කරනු ලැබී ඇති බවට නිෂ්පාදකයාගෙන් ලබාගත් සහතිකය ලංසුකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු වේ. |
| 8. | මිල යෝජනාවේ වලංගු කාලය. | 8.1 | ලංසු ඉදිරිපත් කිරීමට දී ඇති අන්තිම දිනෙන් පසු දින හැටක් (60) තුළ මිල යෝජනා වලංගුව පවතී. |
| 9. | මිල යෝජනාව අත්සන් කිරීම ආකෘතිය. | 9.1 | මිළ යෝජනාව යතුරු ලේඛණය කිරීමෙන් හෝ නොමැකෙන තීන්තෙන් ලිවිය යුතු අතර, ලංසුකරු වෙනුවෙන් අත්සන් කිරීමට නියමිත පරිදි බලය ලබාදෙන ලද පුද්ගලයකු විසින් ලංසුකරු වෙනුවෙන් අත්සන් කළ යුතුය. |
| D. මිළ යෝජනා ඉදිරිපත් කිරීම හා විවෘත කිරීම. | | | |
| 10. | මිල යෝජනා ඉදිරිපත් කිරීම. | 10.1 | ලංසුකරු විසින් ඔවුන්ගේ මිළ ලේඛණ මුද්‍රා තැබූ කවර තුළ බහා විශේෂ කොන්ත්‍රාත් හඳුනාගැනීමේ අංකය ලියා ගැනුම් කරුගේ ලිපිනයට ගෙනවිත් භාරදීම හෝ තැපැලෙන් එවීම කළ යුතුවේ. |
| | | 10.2 | උපදෙස් දී ඇති පරිදි මිල ලේඛණවල මුද්‍රා තබා නොතිබීමෙන් හා සලකුණු නොයෙදීමෙන් වන අස්ථානගතවීම හා බලාපොරොත්තු රහිත විවෘත කිරීම් සම්බන්ධයෙන් ගැණුම් කරු වගකියනු නොලැබේ. |
| 11. | මිල යෝජනා ඉදිරිපත් කිරීමේ අවසාන දිනය. | 11.1 | 2 වන කොටසේ දත්ත පත්‍රිකාවේ පෙන්වා දී ඇති දිනට හා වෙලාවට පෙර මිල යෝජනා ගැණුම්කරු වෙත ලැබිය යුතුවේ. |
| 12. | ප්‍රමාද වී ලැබෙන ලංසු. | 12.1 | නියමිත දිනට පසුව, ප්‍රමාද වී ලැබෙන කවර හෝ ලංසුවක් ඉහත දැක්වූ 11.1 වගන්තිය ප්‍රකාර ගැණුම් කරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. |
| 13. | මිල යෝජනා විවෘත කිරීම. | 13.1 | දත්ත පත්‍රිකාවේ නිශ්චිතව පෙන්වා දී ඇති ලිපිනයේදී , දිනයේදී හා සඳහන් වේලාවෙ දී ප්‍රසිද්ධියේ ගැනුම් කරු විසින් මිළ යෝජනා විවෘත කරනවා ඇත. |
| | | 13.2 | ලංසු කරුගේ නියෝජිතයෙකුට එම අවස්ථාවට පැමිණ තමන්ගේ පැමිනීම සටහන් තළ හැකිවේ. |
| E. මිළ යෝජනා ඇගැයීම හා සංසන්දනය කර බැලීම. | | | |
| 14. | පැහැදිලි කිරීම. | 14.1 | මිළ යෝජනා පරීක්ෂා කිරීමේ දී, ඇගැයීමේදී හා සංසන්දනය කිරීමේ දී ගැණුම්කරු තම අභිමතය පරිදි තමන්ගේ මිළ යෝජනා පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස ලංසුකරුවෙකුගෙන් ඉල්ලා සිටිය හැකිවේ. ලංසු කරුවෙකු |

| | | | |
|---|---|---|---|
| | | | විසින් තම මිළ යෝජනා පිළිබඳව කරන පැහැදිලි කිරීම් ගැණුම් කරුගේ ඉල්ලීමට ප්‍රතිචාර නොදක්වන්නේනම් එබඳු මිළ යෝජනා සලකා නොබැලේ. |
| | | 14.2 | පැහැදිලි කිරීම පිළිබද ගැණුම් කරුගේ ඉල්ලීම හා ඊට දක්වන ප්‍රතිචාරය ලිඛිතව විය යුතුවේ. |
| 15. | මිළ යෝජනාවල ප්‍රතිචාරාත්මක භාවය. | 15.1 | ලැබී ඇති යෝජනාවල අන්තර්ගත කරුණු මත මිල යෝජනා ප්‍රතිචාරාත්මක ද නැද්ද යන්න ගැණුම්කරු විසින් තීරණය කරනවා ඇත. |
| | | 15.2 | මිළ යෝජනාවක් ඇගැයීමට ලක්කිරීමේ දී සපයා ඇති ලේඛණවලට සාරානුකූලව ප්‍රතිචාර දක්වා නැතැයි හැගී ගියහොත් එබදු යෝජනා ගැණුම් කරු විසින් ප්‍රතික්ෂේප කෙරේ. |
| 16. | මිළ යෝජනා ඇගයීම. | 16.1 | සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇතැයි තීරණය කරනු ලැබ ඇති මිළ යෝජනා ගැණුම් කරු විසින් ඇගයීමට ලක් කෙරේ. |
| | | 16.2 | මිළ යෝජනාවක් ඇගයීමේ දී ගැණුම්කරු පහත දැක්වෙන කරුණු සලකා බලනු ඇත.<br>(අ) ඉදිරිපත් කර ඇති මිළ ගණන්.<br>(ආ) අංක ගණිතමය දෝශ නිවැරදි කිරීම සඳහා මිළ ගැළපීම.<br>(ඇ) ලබාදෙන වට්ටම් සඳහා මිළ ගැළපීම්. |
| | | 16.3 | ගැණුම්කරු මිල යෝජනා ඇගයීමට මිල යෝජනාවේ මිලට අතිරේකව වෙනත් සාධක සලකා බැලීමට අවශ්‍යවන බව II කොටසේ දත්ත පත්‍රිකාවේ දක්වා ඇත්නම්, එහි දක්වා ඇති භාණ්ඩවල ලක්ෂණ ක්‍රියාකාරීත්වය සහ නියමයන් සහ කොන්දේසී ආදී සාධක සලකා බලනු ලැබේ. |
| 17. | කවර හෝ මිළ යෝජනාවක් පිළි ගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ සියළුම යෝජනා ප්‍රතික්ෂේපකිරීමට ගැණුම් කරුගේ බලය. | 17.1 | කිසියම් ලංසුවක් පිලිගැනීමට හෝ මිල ගණන් ඉදිරිපත්කල අය සමඟ කිසිදු බැදීමක් ඇතිකර ගැනීමට පෙර ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ මිල කැදවීමේ ක්‍රියාවලිය අවලංගු කිරීමට ගැණුම් කරුට ඕනෑම අවස්ථාවක අයිතිය ඇත්තේය. |
| F. | කොන්ත්‍රාත්තුව පැවරීම. | | |
| 18. | මිළ යෝජනාවක් පිළිගැනීම. | 18 | ලංසුකරුවකු විසින් ඉදිරිපත් කර ඇති, නිකුත් කර ඇති ලේඛණ අනුව සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති,අඩුම අගයන ලද මිල ලෙස තීරණයක් කර ඇති මිල ගැණුම්කරු විසින් පිළිගනු ලැබේ. |
| 19. | පිළිගත් බව දැන්වීම. | 19.1 | තම මිළ යෝජනාව පිළිගත් බව එහි වලංගු කාලය ඉකුත්ව යාමට පෙර සාර්ථක ලංසු කරුට ගැණුම්කරු ලිඛිතව දන්වා යනු ලැබේ. |

**සැලකිය යුතුයි: මෙම උපදෙස් පත්‍රිකාව ඒක් වරක් පමණක් ඔබ වෙත ලබා දීමට කටයුතු කරන අතර අප ආයතනය විසින් සිදුකරනු ලබන ඉදිරි මිල කැදවීම් සඳහා ද එහි සදහන් උපසදෙස් අනුව කටයුතු කරන ලෙස දන්වා සිටිමු. එබැවින් මෙම උපදෙස් පත්‍රිකාව සුරැකිව තබා ගන්න. තවද ඔබට මෙම උපදෙස් පත්‍රිකාව මුදල් අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන්ද ලබා ගැනීමේ හැකියාව ඇත.**

**(https://www.treasury.gov.lk/api/file/0ee96794-fc31-4235-9b21-3b6c59833090)**

**https://www.treasury.gov.lk> Home >Procurement> Stranded Bidding Document> Procurement of Goods under National Sopping**